ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ  සන්නිවේදන දෙපාර්තමේන්තුව

දිනය  2014 ඔක්තෝබර් 10

## ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය පද්ධතිය ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා බදු දිරිගැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරයි

ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකගත්වය ඇතිව, සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් මූල්‍ය ආයතන අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ පිරිවැය නිර්ණය කිරීමට සහ ඕනෑම අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බැරකම් මත ඉල්ලා සිටීමේ හැකියාව සඳහා, පිළිවෙලින්, දේශීය ආදායම් පනතේ සහ එකතු කළ අගය මත බදු පනතේ සඳහන් නියමයන්ට අනුව මාර්ගෝපදේශ නිකුත් කරයි. මෙම මාර්ගෝපදේශයන් බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හා විශේෂිත කල්බදු සමාගම් සඳහා 2014 අප්‍රේල් 01 දින සිට බලපවත්වනු ඇත.

මෙම මාර්ගෝපදේශයන්, ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මෙන් යුතුව අත්පත්කර ගැනීමේ, ව්‍යාපාර කොටස් අත්පත්කර ගැනීමේ හා වෙනත් බැංකු, මූල්‍ය සමාගම් හෝ කල්බදු සමාගම් සමඟ ඒකාබද්ධවීම් සම්බන්ධව පිරිවැයෙහි අන්තර්ගත අයිතමයන් නියම කරයි. ඒ අනුව අත්පත්කර ගැනීමේ පිරිවැයට, ගැනුම් ප්‍රතිෂ්ඨාව, වෘත්තීයමය ගාස්තු, ලිපිලේඛන ගාස්තු, තොරතුරු පද්ධති සඳහා වන වියදම්, මානව සම්පත් සම්බන්ධ පිරිවැය, ප්‍රචාරණ වියදම් සහ අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ දී යොදවන ප්‍රාග්ධනය ඇතුලත් වේ.

මෙම පිරිවැය අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ වර්ෂයේ තක්සේරු කරන ලද ආදායමෙන් 1/3 ක උපරිමයකට යටත්ව අඩුකර ගැනීමට අවසර දෙනු ලැබේ. එසේ වුවද, අත්පත්කර ගන්නා මූල්‍ය ආයතනයේ තක්සේරු කළ හැකි ආදායම රුපියල් මිලියන 300 ට වඩා අඩු වන්නේ නම් සුදුසුකම් ලැබීමේ ගෙවීම්, තක්සේරු කළ හැකි ආදායම දක්වා අඩු කරගත හැකි අතර, ශේෂය අනාගත තක්සේරු කළ හැකි

ආදායමෙන් හිලව්කර ගැනීමට හැකිවනු ඇත. අත්පත්කර ගැනීමේදී/ඒකාබද්ධ කිරීමේදී පවරනු ලබන කොටස් ගැසට් නිවේදනයක් මගින් මුද්දර ගාස්තු වලින් නිදහස් කෙරෙනු ඇත.

මෙම මාර්ගෝපදේශයන් මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ක්‍රියාමාර්ගය තවදුරටත් ඉදිරියට ගෙන යාමට හා දැනටමත් සිදුවෙමින් පවත්නා බැංකු, මූල්‍ය සමාගම් හා කල්බදු සමාගම් ඒකාබද්ධ කිරීමේ හා අත්පත්කර ගැනීමේ ක්‍රියාමාර්ගය කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට අනුබල දෙනු ලබයි. මෙමගින් මූල්‍ය පද්ධතිය තවදුරටත් ශක්තිමත්ව හා ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා වන ශ්‍රී ලංකා රජයේ සහ මහ බැංකුවේ කැපවීම තහවුරු කරයි.

මෙම මාර්ගෝපදේශ www.cbsl.gov.lk යන මහ බැංකු වෙබ් අඩවියෙහි ඇතුලත්ව ඇත.